Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අර්ධ වාර්ෂික පරීක්ෂණය - 2019

## 9 ශ්‍රේණිය
## භූගෝල විද්‍යාව

**නම/විභාග අංකය :-- ..................................................................................** **කාලය : පැය දෙකයි.**

**I කොටස**

- **සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

- **අංක 01 සිට 05 තෙක් ප්‍රශ්නවල එක් එක් හිස්තැනට ගැළපෙන පිළිතුර වරහන තුළින් තෝරන්න.**

01. ආසියා මහාද්වීපය පෘථිවියේ උතුරු අර්ධ ගෝලයේ ................................................................ අර්ධයේ පිහිටා ඇත. (බටහිර, නැගෙනහිර, උතුරු)

02. ආසියා මහාද්වීපය ආසියාවෙන් වෙන් වන්නේ ................................................................ මඟිනි. (සූවස් ඇළ, පැනමා ඇළ, අස්වාන් ඇළ)

03. ලෝකයේ වැඩිම වර්ෂාපතනයක් ඇති ...................................................... පිහිටා ඇත්තේ ඉන්දියාවේ මෙඝාල ප්‍රාන්තයේ ය. (චිරාපුංජි, මයිසූර්, කල්කටා)

04. ලෝකයේ විශාලම වාරිමාර්ග පද්ධතිය ඇත්තේ ............................................ ය. (පාකිස්ථානයේ, ඉන්දියාවේ, ඉරාකයේ)

05. ගං මෝය ප්‍රදේශවල වැලි තැන්පත් වීම නිසාත්, ගංගා පිටාර ගැලීම හේතු කොටගෙන පහත් බිම්වල ජලය රැඳීම නිසා ................................................................ නිර්මාණය වේ. (තැනිතලා, ගංමෝය, වගුරුබිම්)

- **ප්‍රශ්න අංක 06 සිට 10 තෙක් ඇති වගන්ති කියවා බලා නිවැරදි නම් (3 ) ලකුණ ද, වැරදි නම් (5 ) ලකුණ ද ඉදිරියේ ඇති වරහන තුළ ලකුණු කරන්න.**

06. ආසියාවේ සාමාන්‍ය ජන ඝනත්වය වර්ග කිලෝමීටරයට 87කි. ( )

07. ටිබෙට් සානුව ''ලෝකයේ පියස්ස'' ලෙස හඳුන්වනු ලැබේ. ( )

08. සර්ඩේරියා හා අමුඩේරියා යන ගංගා ඒරල් මුහුදට ගලා බසින අභ්‍යන්තර ගංගාවෝ වෙති. ( )

09. හොන්ඩා, යමහා, ෂුසුකි, යනු ජපානයේ මෝටර් රථ නිපදවන සමාගම් වේ. ( )

10. ශ්‍රී ලංකාවේ සමස්ථ ජලවහන රටාව අරීය රටාවක් පෙන්වයි. ( )

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

**අංක 11 සිට 15 තෙක් ප්‍රශ්නවලට සුදුසු වචන යොදා හිස්තැන් පුරවන්න.**

11. ඛාදනයට ලක්වී ඉතිරිව ඇති තද පාෂාණ කුට්ටි ................................................................ කඳු ලෙස හඳුන්වයි.

12. භූමියේ උස අනුව උෂ්ණත්වය අඩුවීම ................................................................ ලෙස හඳුන්වයි.

13. පරිසරයේ කටුක බවින් මිදීමටත් වනසතුන් හා සතුරන්ගෙන් ආරක්ෂාවීමටත් සාමූහිකව ජීවත් වීමටත් මිනිසුන් ඒකරාශී වීමෙන් ..................................................... බිහිවේ.

14. නිදහස් වෙළෙඳ මධ්‍යස්ථානයක් මෙන්ම මැද පෙරදිග ප්‍රධාන අපනයන මධ්‍යස්ථානය වන ජෙබිල් අලි වරාය පිහිටා ඇත්තේ ........................................... වලය.

15. ශ්‍රී ලංකාවට බලපාන වාසුලි වැසි ඇතිවන්නේ ................................................................ ප්‍රදේශයේ ය.

**අංක 16 සිට 20 තෙක් ප්‍රශ්නවල නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.**

16. ආසියාවේ ඉහළම උෂ්ණත්වය පවතින ජාකෝබාබාද් නගරය පිහිටා ඇත්තේ,
    (1) ජපානයේ ය.
    (2) ඉන්දියාවේ ය.
    (3) පකිස්ථානයේ ය.
    (4) බංගලිදේශයේ ය.

17. කඳුකරයේ නැගෙනහිර ප්‍රදේශවල පිහිටා ඇත. වර්ෂාපතනය මිලිමීටර 1750 2000 අතර වේ. කඳුකරයේ සුළං මුවාවේ පිහිටා ඇති දේශගුණ කලාපය වන්නේ,
    (1) අර්ධ ශුෂ්ක කලාපයයි.
    (2) කඳුකර වියළි කලාපයයි.
    (3) කඳුකර තෙත් කලාපයයි.
    (4) අතරමැදි කලාපයයි.

18. ශ්‍රී ලංකාවේ ජන සංඛ්‍යාවෙන් 1/4ක් පමණ ඒකරාශී වී ඇත්තේ,
    (1) සබරගමු පළාතේ ය.
    (2) දකුණු පළාතේ ය.
    (3) වයඹ පළාතේ ය.
    (4) බස්නාහිර පළාතේ ය.

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

19 ශ්‍රී ලංකාවේ භූ ලක්ෂණ දැක්වීම සඳහා 1 : 50,000 මෙට්‍රික් සිතියම් පත්‍ර කීයක් සකස් කර තිබේ ද?

(1) 108 කි. (2) 92 කි.

(3) 95 කි. (4) 85 කි.

20. පහතර තෙත් කලාපීය වනාන්තර ව්‍යාප්තව ඇති ප්‍රදේශ ඇතුළත් පිළිතුර වන්නේ,

(1) සෝමාවතිය, විල්පත්තුව, මාදුරුඔය

(2) කුරුණෑගල, බදුල්ල, මාතලේ


(3) සිංහරාජය, කන්නෙලිය, මොරපිටිය

(4) හෝර්ටන් තැන්න, සීතාඑළිය, අඹේවෙල

## II කොටස

- **පළමුවන ප්‍රශ්නය අනිවාර්ය වේ. එහි "අ", "ආ" යනුවෙන්, කොටස් දෙකකි. එම කොටස් දෙකටම පිළිතුරු සපයන්න.**
- **තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.**
- **ඔබ පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව පහකි.**

01. (අ) ඔබ වෙත සපයා ඇති ආසියානු ප්‍රදේශයේ සිතියමේ ලකුණු කොට ඇති ස්ථාන හඳුනාගෙන ඊට අදාළ ඉංග්‍රීසි අක්ෂරය ඔබේ පිළිතුරු පත්‍රයේ පිළිවෙළින් ලියා දක්වන්න.




(i) පැසිපික් සාගරය .................... (ii) කැස්පියන් මුහුද ....................

(iii) හිමාලය .................... (iv) ගංගා නම් ගඟ ....................

(v) මුම්බායි .................... (vi) ජපානය .................... (ලකුණු 06)

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

(ආ) ඔබ වෙත සපයා ඇති ශ්‍රී ලංකා සිතියමේ ලකුණු කොට ඇති ස්ථාන හඳුනාගෙන ඊට අදාළ ඉංග්‍රීසි අක්ෂරය ඔබේ පිළිතුරු පත්‍රයේ පිළිවෙළින් ලියා දක්වන්න.

(i) කළු ගඟ ......................

(ii) අනුරාධපුර දිස්ත්‍රික්කය ......................


(iii) මන්නාරම් දූපත ......................

(iv) ත්‍රිකුණාමලය ......................

(v) මීගමු කලපුව ......................

(vi) යාපනය ......................

(ලකුණු 06)




(02) (i) ආසියා මහාද්වීපයට අයත් දූපත් තුනක් නම් කරන්න. (ලකුණු 03)

(ii) ආසියා මහාද්වීපයේ පිහිටා ඇති ලෝකයේ ඉපැරණි ශිෂ්ටාචාර දෙකක් සඳහන් කරන්න. (ලකුණු 04)

(iii) (a) - ආසියානු ප්‍රදේශය දක්නට ලැබෙන තැනිතලාවක් හා සානුවක් නම් කරන්න. (ලකුණු 02)

(b) - ආසියානු ප්‍රදේශය ලෝකයේ අනෙක් ප්‍රදේශවලින් වෙන්කර හඳුනාගත හැකි සුවිශේෂී ලක්ෂණ දෙකක් දක්වන්න. (ලකුණු 03)

(03) (i) ආසියා මහාද්වීපය තුළ පැතිර පවතින ප්‍රධාන දේශගුණික කලාප තුනක් සඳහන් කරන්න. (ලකුණු 03)

(ii) ආසියාවේ පැතිර ඇති නිවර්තන වර්ෂා වනාන්තරවල ලක්ෂණ හතරක් සඳහන් කරන්න. (ලකුණු 04)

(iii) (a) - කේතුධර වනාන්තරවල ජීවත් වන සත්ත්ව විශේෂ දෙකක් නම් කරන්න. (ලකුණු 02)

(b) - කේතුධර වනාන්තරවල විශේෂ ලක්ෂණ දෙකක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 03)

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com


(04) (i) ආසියාවේ ප්‍රධාන කාර්මික රටවල් දෙකක් නම් කරන්න. (ලකුණු 03)

(ii) පකිස්ථානයේ කෘෂිකර්මයේ විශේෂ ලක්ෂණ දෙකක් සඳහන් කරන්න. (ලකුණු 04)

(iii) (a) - ජපානයේ කාර්මික නිෂ්පාදන දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02)

(b) - ආසියාවේ සේවා මධ්‍යස්ථානයක් ලෙස ඩුබායිවල වැදගත්කම හේතු දෙකක් මගින් විස්තර කරන්න. (ලකුණු 03)

(05) යාබද සිතියමේ දක්වා ඇත්තේ ශ්‍රී ලංකාවේ භූ විෂමතා කලාප වේ.





(i) සිතියමේ අංක 01, 02, 03 යන භූ විෂමතා කලාප තුන නම් කරන්න. (ලකුණු 03)

(ii) අංක 01 කලාපයේ දක්නට ලැබෙන භූ විෂමතා ලක්ෂණ හතරක් සඳහන් කරන්න. (ලකුණු 04)

(ii) (a) - සිතියමේ C අක්ෂරයෙන් දක්වා ඇති සමෝච්ඡ රේඛාවේ උස මීටර කීය ද? (ලකුණු 02)

(b) - ශ්‍රී ලංකාවේ උෂ්ණත්ව ව්‍යාප්තියේ වෙනස්කම්වලට බලපාන සාධක දෙකක් විස්තර කරන්න. (ලකුණු 03)

(06) (i) ශ්‍රී ලංකාවේ ප්‍රධාන වනාන්තර කලාප යාබද සිතියමේ A,B,C වලින් දක්වා ඇත. ඒවා පිළිවෙළින් නම් කරන්න. (ලකුණු 03)




(ii) වෘක්ෂලතා වර්ධනය කෙරේ බලපාන සාධක දෙකක් සඳහන් කරන්න. (ලකුණු 04)

(ii) (a) - පහතරට වියළි මිශ්‍ර සදාහරිත වනාන්තර ව්‍යාප්තව ඇති ප්‍රදේශ දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02)

(b) - එම වෘක්ෂලතා කලාපයේ විශේෂ ලක්ෂණ දෙකක් විස්තර කරන්න. (ලකුණු 03)

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

(07) (i) ශ්‍රී ලංකාවේ ජන සංඛ්‍යාව අඩුම හා වැඩිම පළාත් දෙක නම් කරන්න. (ලකුණු 03)

(ii) කොළඹ දිස්ත්‍රික්කය තුළ ජන සංඛ්‍යාව වැඩිවීමට බලපාන හේතු හතරක් දක්වන්න. (ලකුණු 04)

(iii) (a) - ශ්‍රී ලංකාවේ ප්‍රධාන ජනාවාස වර්ග දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02)

(b) - ඉන් එක් ජනාවාසයක ප්‍රධාන ලක්ෂණ දෙකක් විස්තර කරන්න. (ලකුණු 03)

(08) (i) ශ්‍රී ලංකාවේ ආර්ථික ක්‍රියාකාරකම්වල ප්‍රධාන අංශ තුන නම් කරන්න. (ලකුණු 03)

(ii) වෙරළබඩ කලාපයට පොදු වූ මිනිස් ක්‍රියාකාරකම් හතරක් සඳහන් කරන්න. (ලකුණු 04)

(iii) (a) - තෙත් කලාපය තුළ වැවෙන වතු භෝග වර්ග දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02)

(b) - මෙම කලාපයේ ජනාධික වීමට බලපා ඇති හේතු දෙකක් විස්තර කරන්න. (ලකුණු 03)

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

**Answer**

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අර්ධ වාර්ෂික පරීක්ෂණය - 2019

## 9 ශ්‍රේණිය

## භූගෝල විද්‍යාව - පිළිතුරු පත්‍රය

**පිළිතුරු පත්‍රය**

### I කොටස

01. නැගෙනහිර
02. සුවස් ඇළ
03. චිරාපුංජි
04. පකිස්ථානයේ
05. වගුරුබිම්
06. (3)
07. (3)
08. (3)
09. (5)
10. (3)
11. ශේෂ
12. පතන සීඝ්‍රතාව
13. ජනාවාස
14. ඩුබායි
15. බෙංගාලබොක්ක
16. (iii) පකිස්ථානයේ
17. (ii) කඳුකර වියළි කලාපය
18. (ii) බස්නාහිර පලාතේය.
19. (ii) 92
20. (iii) (සිංහරාජය, කන්නෙලිය, මොරපිටිය)

### II කොටස

(01) (අ) (1) B
(2) D
(3) E
(4) G
(5) J
(6) M

(ආ) (1) B
(2) D
(3) F
(4) E
(5) A
(6) C

(ලකුණු 20)

(02) (1) ජපන් දූපත්, ජාවා, සුමත්‍රා, අන්දමන්, ශ්‍රී ලංකාව, නිකොබාර්, මාලදිවයින, තායිවානය, පිලිපීන් දූපත් ආදිය

(2)
- ඉන්දුනිම්න ශිෂ්ටාචාරය
- යුපුටීස් ටයිග්‍රීසි ශිෂ්ටාචාරය
- හොවැංහෝ ශිෂ්ටාචාරය

(3) (a) **තැනිතලාවන් :**
- සයිබීරියානු තැන්න, මැංචූරියා තැන්න චීන මහා තැන්න

**සානු :**
- ඩෙකැන් සානුව
- සයිබීරියානු සානුව
- මොංගෝලියානු සානුව
- ඉරාන සානුව
- අරාබි සානුව

(b)
- විශාලම මහාද්වීපය වීම.
- සියලුම දේශගුණ වර්ග පිහිටා තිබීම.
- ප්‍රධාන ආගම් රැසක් තිබීම.
- වැඩිම ජනසංඛ්‍යාවක් සිටීම.
- ලෝකයේ විශාලම කඳු පද්ධතිය සහ වඩාත් උසම කඳු ශිඛර පිහිටා තිබීම.

(03) (1)
- නිවර්තන කලාපය
- සෞම්‍ය කලාපය
- ශීත කලාපය

(2)
- ශාක ස්ථර කිහිපයක් තිබීම.
- වැල් වර්ග බහුල වීම.
- පෙද පාසි වර්ග මෙන්ම අපිශාබ බහුල වීම.
- ජෛව විවිධත්වය බහුලවීම.
- මහෝගනී, එබොනි, කළුවර, උණවර්ග වැනි ශාක බහුල වීම.
- විවිධ උසින් යුතු ශාක තිබීම.

(3) (a)
- පිනිමුවා, හිමවලසා, හිම නරියා, හිමබල්ලා, සේබල්, මින්ක් වැනි සත්ත්ව විශේෂ

(b)
- කේතු රූපාකාර ගස් තිබීම.
- ශාක පත්‍ර ඉඳිකටු තුඩ වැනි හැඩ සහිත වීම.
- ශාක පත්‍ර සිහින් වීම.
- හිම පතනයට ඔරොත්තු දීම සඳහා ගස් කේතුවක් සේ සැදී ඇත.
- ලයිකන, පෙද පාසි බහුල වීම.

(04) (1) ජපානය, කොරියාව, චීනය, ඉන්දියාව, සිංගප්පූරුව

(2)
- ආර්ථිකයේ ප්‍රධාන අංගය වීම.
- ශ්‍රමිකයන්ගෙන් 43%ක්ම කෘෂිකර්මාන්තයේ නියැලීම.
- කන්න දෙකක් වගා කිරීම. (කාරිෆ්/ රාබි)
- ප්‍රධාන කපු නිෂ්පාදනය කිරීම හා ලෝකයේ 4වන ස්ථානය හිමිකර ගෙන සිටීම.
- කපු, සහල්, අඹ නිෂ්පාදනය අතින් ලෝකයේ 4 වන ස්ථානය හිමිකරගෙන තිබීම.

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

**Answer**

(3) (a) මෝටර් රථ, විදුලි උපකරණ, යන්ත්‍රෝපකරණ, නැව්, රසායන ද්‍රව්‍ය, රෙදිපිළි, පරිගණක උපාංග, රොබෝ තාක්ෂණය ආදිය

(b) • පෙර අපර දෙදිග සම්බන්ධ වන ගුවන් මාර්ගයේ සන්ධිස්ථානයක් වීම.
- • නිදහස් වෙළෙඳ වරායක් වීම.
- • මැද පෙරදිග අපනයන මධ්‍යස්ථානයක් වීම.
- • සංචාරක ආකර්ෂණ හා සේවා සපයන මධ්‍යස්ථානයක් වීම.
- • ක්‍රීඩාංගන පහසුකම් තිබීම.
- • ලෝකයේ විශාලම වෙළෙඳ මධ්‍යස්ථානය වීම.

(05) (1) 1. මධ්‍යම කඳුකරය
2. අභ්‍යන්තර තැනිතලාව
3. වෙරළබඩ තැන්න

(2) මධ්‍යම කඳුකරය - කඳු, සානු, දියඇලි, කපොලු, දුර්ග මාර්ග

(3) (a) • C මීටර් 30 රේඛාව

(b) • ඉන්දියානු මහාද්වීපයට ආසන්නව පිහිටා තිබීම.
- • උන්නතාංශය (භූමියේ උස)
- • මුහුදේ සිට ඇති දුර
- • වෙනස්වන සුළං රටාව
- • ද්වීපයක් ලෙස පිහිටා තිබීම.

(06) (1) A - පහතරට තෙත් වනාන්තර
B - කටුපඳුරු හා ලඳු කැළෑ
C - අතරමැදි සදාහරිත වනාන්තර

(2) උෂ්ණත්වය, වර්ෂාපතනය, පස

(3) (a) • සෝමාවතිය, විල්පත්තු, මාදුරුඔය, උඩවලව, යාල, වස්ගමුව

(b) • වර්ෂා කාලයේ ගස් වැවේ.
- • වියළි කාලයේ දී ශාක වර්ධනය අඩුය.
- • ඝන වනාන්තර නොවන අතර තැනින් තැන උස ගස් ඇත.
- • තද අරටු සහිත ශාක ඇත.
- • වනාන්තර ළා කොළ පැහැයක් ගනී.
- • බුරුත, කළුවර, තේක්ක, සූරිය මාර, කොහොඹ වැනි තද අරටු සහිත ශාක ඇත.

(07) (1) අඩුම උතුරු පළාත/ වැඩිම බස්නාහිර පළාත

(2) • පරිපාලනමය නගරයක් වීම.
- • වානිජමය නගරය වීම.
- • ප්‍රවාහන, අධ්‍යාපන, සෞඛ්‍ය සේවා බහුල වීම.
- • වෙළඳ කටයුතු, වරාය කටයුතු ප්‍රධාන වීම.
- • සියලුම සේවා පහසුකම් වැඩිවීම.

(3) (a) • නාගරික, ග්‍රාමීය, ගැමි නාගරික

(b) **ග්‍රාමීය**
- • කෘෂිකර්මාන්තය ප්‍රධාන ජීවනෝපාය වීම.
- • යටිතල පහසුකම් අඩුවීම.
- • නිවාස ඈතින් පිහිටීම.
- • වැව් ආශ්‍රිත ව්‍යාප්ත වීම.
- • හේන්වගාව
- • විදුලිය, අධ්‍යාපන පහසුකම් අඩුවීම.
- • ජනයා අඩුවෙන් ව්‍යාප්ත වීම.

**නාගරික**
- • ජනයා වැඩිවීම.
- • පහසුකම් වැඩිවීම.
- • විදුලිය, ජලය, අධ්‍යාපන පහසුකම් වැඩිවීම.
- • නිවාස තදබදය, තට්ටු ගෙවල්, මුඩුක්කු පරිසර ඇත.
- • පරිසර දූෂණය වැඩිය.

**ගැමි නාගරික**
- • ගම හා නගරයේ ලක්ෂණ තිබීම.
- • පහසුකම් මධ්‍යස්ථ මට්ටමේ පැවතීම.
- • නිවස තදබදය, සටන් විරෝධී ක්‍රියා වැඩිවීම.
- • පරිසර දූෂණය

(08) (1) කෘෂිකාර්මික, කාර්මික, සේවා

(2) • ධීවර කර්මාන්තය
- • හිරිගල් හා හුණුගල් කර්මාන්තය
- • හෝටල් හා සංචාරක කර්මාන්තය
- • පොල් ආශ්‍රිත, කොහු ඉදල් විසිතුරු භාණ්ඩ
- • ලුණු කර්මාන්තය
- • මුතුපර, වරාය

(3) (a) • තේ, පොල්, රබර්, කෝපි, කොකෝවා, කුරුඳු

(b) • තෙත් දේශගුණය/ අඩු උෂ්ණත්වය
- • ප්‍රවාහන පහසුව
- • ජල පහසුව තිබීම.
- • දියුණු ප්‍රවාහන පද්ධතියක් පැවතීම.
- • විවිධ භෝග වගාකිරීමේ හැකියාව
- • සම්පත් බහුල වීම.
- • වානිජමය හා පරිපාලනමය කටයුතු කේන්ද්‍රගත වූ නගර පිහිටා තිබීම.